UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2014 (AUGUST 2015)
ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (2015 අගෝස්තු)

Buddhist Philosophy - I / බෞද්ධ දර්ශනය- I - BPG - 1
(ආචාර විද්‍යාව හා මනෝවිද්‍යාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ. )

(කාලය - පැය තුනයි)

## I - කොටස

1. "ප්‍රාග්බෞද්ධ භාරතයේ ආගමික චාරිත්‍ර සම්බන්ධයෙන් බුදුන්වහන්සේ සදාචාර විචාරකයෙකුගේ කාර්යය ඉටු කළහ". සාකච්ඡා කරන්න.

2. බෞද්ධ ප්‍රතිපදාවේ පරමාර්ථය වන්නේ සදාචාරාත්මක හොඳ සහ නරක අතර විශේෂත්වය ඉක්මවා යාමය යන මතය ගැන අදහස් දක්වන්න.

3. "තමන් රකින්නා අනුන් රකියි, අනුන් රකින්නා තමන් රකියි" යන බුදුන් වහන්සේගේ ප්‍රකාශනයෙහි ආචාරවිද්‍යාත්මක වැදගත්කම පැහැදිලි කරන්න.

4. සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ඇති සදාචාරාත්මක ලක්ෂණ පැහැදිලි කරන්න.

5. දණ්ඩනයෙහි සදාචාරාත්මක බව පිළිබඳව බෞද්ධ ඉගැන්වීම්වලින් කුමක් ගම්‍ය වන්නේදැයි විමසන්න.

අනෙක් පිටුවට ...

## II - කොටස

6. මනස පිළිබඳ බෞද්ධ සංකල්පය කය හා මනස පිළිබඳ නියත ද්වයතාවෙන් බැහැර වන අයුරු පැහැදිලි කරන්න.

7. බුදු සමයේ ඉගැන්වෙන දුක්ඛ හා සමුදයාර්යසත්‍යයන් සම්බන්ධ ඉගැන්වීම් කොතරම් දුරට මනෝවිද්‍යාත්මකදැයි පෙන්වා දෙන්න.

8. පරිපීඩක චිත්තවේග හසුරුවා ගැනීම සඳහා භාවිත කළ හැකි බෞද්ධ උපදෙස් විධි පැහැදිලි කරන්න.

9. පෞරුෂ වර්ධනය සඳහා බුදුසමයාගත ඉගැන්වීම් සාකච්ඡා කරන්න.

10. පුද්ගල වර්ගීකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල ඇති මනෝවිද්‍යාත්මක ලක්ෂණ පරීක්ෂා කරන්න.

=========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2014 (AUGUST 2015)
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (2015 අගෝස්තු)

Buddhist Philosophy - II / බෞද්ධ දර්ශනය- II - BPG - 2
(බෞද්ධ දර්ශන ඉතිහාසය, තුලනය හා ව්‍යවහාරය)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ. )

(කාලය පැය තුනයි)

---

1. බුදු සමයේ උදාවත් සමග සමකාලීන දාර්ශනික චින්තාවලියේ සිදුවූ වෙනස්කම් පැහැදිලි කරන්න.

2. "සියලු ආධ්‍යාත්මික අනුභූතින් ජීවිත අත්දැකීමක් ලෙස බුදුසමය නිර්දේශ කරයි". සාකච්ඡා කරන්න.

3. දර්ශන ක්ෂේත්‍රයේ දෘෂ්ටිග්‍රාහී ආකල්පය පිළිබඳව බුදුන් වහන්සේගේ විචාරය පරීක්ෂා කරන්න.

4. බෞද්ධ ඉගැන්වීම් කෙතෙක් දුරට නූතන විද්‍යාත්මක ලෝක දෘෂ්ටිය සමග අනුකූල වන්නේදැයි පරීක්ෂා කරන්න.

5. බෞද්ධ නිකායාන්තරික මතවාද ඇසුරින් බුදු සමයේ ව්‍යාප්තිය හා දර්ශන වාද බිහිවූ ආකාරය විමසන්න.

6. ථේරවාදීන්ගේ විමර්ශනයන්ට අනුව සර්වාස්තිවාදීන්ගේ මතවාද ප්‍රතික්ෂේප වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

අනෙක් පිටුවට ...

7. ක්ෂණවාදය යනු කුමක්ද? සෞත්‍රාන්තික ඉගැන්වීම් ඇසුරින් පරීක්ෂ කරන්න.

8. විඥානවාදී යෝගාචාර දර්ශනය ආත්මවාදී ඉගැන්වීමක් වශයෙන් හැඳින්විය නොහැක්කේ කුමක් නිසාදැයි විමසන්න.

9. මාධ්‍යමක දර්ශනයේ ඉගැන්වෙන ශුන්‍යතාව හා ථේරවාද සම්ප්‍රදායේ ඉගැන්වෙන පටිච්චසමුප්පාදය අතර ඇති සබැඳියාව පරීක්ෂා කරන්න.

10. පහත සඳහන් මාතෘකා හතරකට කෙටි සටහන් ලියන්න.

(අ) බෞද්ධ හීනයානික මතවාද

(ආ) නාගර්ජුන පාදයෝ

(ඇ) ආර්යදේව හිමි

(ඈ) දින්නාග හිමි

(ඉ) පරමාර්ථ සත්‍යය

(ඊ නෛරාත්ම්‍ය සංකල්පය

=========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - 2014 (AUGST 2015)
ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (2015 අගෝස්තු)

Buddhist Philosophy - III / බෞද්ධ දර්ශනය- III - BPG - 3
(පාරභෞතික විද්‍යාව හා ඥානමීමාංසාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.) (කාලය පැය තුනයි.)

---

## I - කොටස

1. අධිභෞතික ප්‍රශ්නයන්ගේ ස්වරූපය පැහැදිලි කරමින් එබඳු ප්‍රශ්න පිළිබඳව බෞද්ධ ආකල්පය සාකච්ඡා කරන්න.

2. බුදුන් වහන්සේ අධිකාරය ඥාන මූලාශ්‍රයක් වශයෙන් ප්‍රතික්ෂේප කරන ලද්දේ මන්ද? සාකච්ඡා කරන්න.

3. බුදුසමයේ අනාත්මවාදය අනුව කර්මය හා පුනර්භවය පිළිබඳ ඉගැන්වීම් පැහැදිලි කළ හැක්කේ කෙසේදැයි පරීක්ෂා කරන්න.

4. බුදුරදුන් විසින් ඇතැම් දාර්ශනික ප්‍රශ්න අව්‍යාකෘත වශයෙන් වර්ග කර දක්වීමට හේතු විමසන්න.

5. බෞද්ධ නිබ්බාණය පාරභෞතික යථාර්ථයක් සේ සැලකිය හැකිද? සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

## II - කොටස

6. බුදුසමයෙහි අනුමාන ඥාණය (අන්වයේ ඥාණය) ධම්මේ ඥාණය මත පදනම් වේ. පරීක්ෂා කරන්න.

7. තර්කය එක ම ඥාන මාර්ගය වශයෙන් සැලකීම බුදුසමයෙන් ප්‍රතික්ෂේප වේ. සනිදර්ශනව පැහැදිලි කරන්න.

8. විමුක්ති සාධනය උදෙසා බුදුසමයෙහි සද්ධාව සතු කාර්යභාරයේ ඥාණවිභාගීය වැදගත්කම විමසන්න.

9. "සත්‍ය වූත්, නිවැරදි වූත්, අර්ථවත් වූත් ප්‍රකාශයක් වුව ද සුදුසු කාලය නොවේ නම් එය බුදුන්වහන්සේ ප්‍රකාශ නොකරති" මේ අනුව බුද්ධ දේශනාවේ ස්වරූපය පහදන්න.

10. බෞද්ධ ඥාන විභාගයේ දී ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයට හිමි තැන සූත්‍ර ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

==========